# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment


| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No DSD/HO/03/ACC/08/මූල්‍ය පාලන-2025 | ඔබේ අංකය<br>உமது இல ..........<br>Your No | දිනය<br>திகதி 2025.04. 25<br>Date |

සමෘද්ධි ගිණුම් චක්‍රලේඛ අංක : 01/2025 (1)

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්/දිස්ත්‍රික් ලේකම්වරුන්
ප්‍රධාන කාර්යාලයේ සියළුම මාණ්ඩලික නිලධාරීන්
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්/නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්/සහකාර අධ්‍යක්ෂවරුන් /ගණකාධිකාරීවරුන්
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්/ගණකාධිකාරීවරුන්
පුහුණු මධ්‍යස්ථාන භාර නිලධාරීන්

**ගිණුම් උපදෙස් හා මූල්‍ය පාලනය පිළිබඳ බලතල පැවරීම - 2025 සංශෝධන අංක 01**

2025 වර්ෂයේ මූල්‍ය පාලන බලතල පැවරීමෙහි පහත වගන්තිවලට ඇතුළත් කර ඇති සංශෝධන ප්‍රකාරව කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි. මෙකී සංශෝධනයන්ට අදාලව 2025 වර්ෂයේ මූල්‍ය බලතල පැවරීමෙහි දක්වා ඇති කිසිඳු උපදෙසක් වෙනස් නොවන බවත්, එම උපදෙස් පරිද්දෙන්ම ක්‍රියාත්මක කළ යුතු බවත් වැඩිදුරටත් දන්වමි.

**08. අතිකාල, නිවාඩු දින වැටුප්, ගමන් වියදම් සහ අමතර රාජකාරි සඳහා දීමනා ගෙවීම**

**8.1 ගමන් වියදම්**

**අයවැය ඇස්තමේන්තු ප්‍රතිපාදන යටතේ ගමන්වියදම් ගෙවීම**

| නිලධාරියාගේ තනතුර | උපරිම මාසික දීමනාව රු. |
|---|---|
| දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ /නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ | 6,000/- |
| සමෘද්ධිකළමණාකරු / විගණන නිලධාරි (දිස්ත්‍රික් විගණන කටයුතු භාරව) | 5,500/- |
| සමෘද්ධි කළමණාකරු / සමෘද්ධි සංවර්ධන නිලධාරි (බැංකු අධීක්ෂණ කටයුතු භාරව) බැංකු අරමුදලින් | 8,500/- |
| සංවර්ධන නිලධාරි (බැංකු අධීක්ෂණ ඒකක භාරව කටයුතු කරන) බැංකු අරමුදලින් | 3000/- |
| සංවර්ධන නිලධාරි (විගණන කාර්යයන්හි නියුතු) බැංකු අරමුදලින් | 3000/- |
| පූර්ණ කාලීනව ක්ෂේත්‍ර කටයුතු වල නියැලෙන සමෘද්ධි කළමනාකරු/සම්බන්ධීකරණ නිලධාරි/ප්‍රවර්ධන නිලධාරි/අභ්‍යන්තර විගණන නිලධාරි/සංවර්ධන නිලධාරි /සමෘද්ධි බැංකු කළමනාකරු / සමෘද්ධි බැංකු සමිති කළමනාකරු | 3,000/- |
| වසම්භාර සමෘද්ධි සංවර්ධන නිලධාරි | 1,000/- |
| සමෘද්ධි සංවර්ධන නිලධාරි ( කලාප සහකාර) | 2,000/- |
| සමෘද්ධි සංවර්ධන නිලධාරි (ව්‍යාපෘති සහකාර) | 2,000/- |
| සමෘද්ධි සංවර්ධන නිලධාරි (සමාජ සංවර්ධන සහකාර) | 2,000/- |
| රියදුරු (ප්‍රධාන කාර්යාලය/ දිස්ත්‍රික් කාර්යාල) | 6,000/- |

- **විගණන කාර්යයන්හි නියුතු සංවර්ධන නිලධාරීන්ට භාණ්ඩාගාර ප්‍රතිපාදන මගින් ලබාදෙන රු 3,000/- ක සීමාවට අමතරව බැංකු අරමුදලින් ද රු 3000/- ක් ගෙවීමට කටයුතු කළ යුතුය. බැංකු අරමුදලින් මෙම ගෙවීම සිදු කළ යුත්තේ 2025 මාර්තු මස සිට ක්‍රියාත්මක වන පරිදිය. අනෙකුත් සංශෝධන 2025 ජනවාරි මස සිට බලාත්මක සේ සළකා කටයුතු කළ යුතුය.**

## 8.2 අතිකාල දීමනා

| නිලධාරියාගේ තනතුර | රජයේ අරමුදලින් ගෙවිය යුතු ප්‍රමාණය (මාසිකව) පැය | බැංකු අරමුදලින් ගෙවිය යුතු ප්‍රමාණය (මාසිකව) පැය |
|---|---|---|
| රියදුරු - වෙන්කළ වාහන | 140 | - |
| රියදුරු - සංචිත වාහන | 100 විශේෂ 40 | පැය 20 |
| ලිපිකරු හා සමාන්තර සේවා | 20 | - |
| කාර්යාල කාර්ය සහයක | 20 | - |
| සමෘද්ධි සංවර්ධන නිලධාරීන් (බැංකුගත) | - | 20 |
| සමෘද්ධි කළමනාකරු MN 04 | 20 | - |
| සංවර්ධන නිලධාරී/සමෘද්ධි සංවර්ධන නිලධාරී (කාර්යාලගත) | 20 | |

## 13. සුළු මුදල් අග්‍රිම

මු.රෙ. 371 (2) (අ) පරිදි දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්ට ගෙවනු ලබන සුළු මුදල් අග්‍රිමය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

| නිලධාරියා/ආයතනය | සුළු මුදල් අග්‍රිම මුදල | එකවර වියදම් කළ හැකිඋපරිම මුදල |
|---|---|---|
| දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ | රු. 25,000/- | රු. 5,000/- |

## 15. වාහන,යන්ත්‍ර හා උපකරණ අලුත්වැඩියා,නඩත්තු

අංක 03 ඡේදය පහත පරිදි සංශෝධනය කරමි.

දෙපාර්තමේන්තුවෙහි වාහන නඩත්තු සම්බන්ධයෙන් රජයේ විගණනය විසින් ලබාදී ඇති නිරීක්ෂණ අනුව ප්‍රධාන කාර්යාලයෙහි වාහන අළුත්වැඩියාවන් සිදු කළ යුත්තේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කරන ලද නිලධාරීන් තිදෙනෙකුගෙන් සැදුම්ලත් කමිටුවක නිර්දේශ මතය.දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාල දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල් විසින් පත්කරන ලද නිලධාරීන් තිදෙනෙකුගෙන් සැදුම්ලත් කමිටුවක නිර්දේශ මත වාහන අළුත්වැඩියා සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය.

දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලයන් හි විධිමත් මිල කැඳවීම් යටතේ වාහන අළුත්වැඩියාවන් සිදු කිරීමේදී ඉතා හදිසි සහ අත්‍යවශ්‍ය අළුත්වැඩියාවන් සිදු කිරීමේ සීමාව පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල් රු 100,000.00
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ රු 50,000.00

## 29. 2025 අයවැය යෝජනා අනුව රාජ්‍ය සේවයේ වැටුප් සංශෝධනය

2025.04.01 සිට වැටුප් හා වැටුප් හා සම්බන්ධ සියළු දීමනා ගෙවීමේදී 2025 අයවැය යෝජනා අනුව රාජ්‍ය සේවයේ වැටුප් සංශෝධනයට උපදෙස් ලබාදී ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 1/2025 මත පදනම්ව කටයුතු කළ යුතුය.2025.04.01 දින සිට අතිකාල ගෙවීමේදී එම චක්‍රලේඛයේ 5. හි උපදෙස් සහ දින වැටුප් ගෙවීමේදී 5.2 අනුව ගණනය කරන ලද 1/30 ක දීමනාව ගෙවීමට කටයුතු කළ යුතුය.සංයුක්ත දීමනා ගෙවීමේදී එම චක්‍රලේඛයේ අනු අංක 21 යටතේ දක්වා ඇති සීමාවන් අනුව ගෙවීම් කළ යුතුය.

සී.ඩී.කළුආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :01.ලේකම් , ග්‍රාමීය සංවර්ධන,සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය : කා.දැ.පි.
02.විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය : කා.දැ.පි
03 ප්‍රධාන අභ්‍යන්තර විගණක : සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව : කා.දැ.පි.